රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 39/2019

මගේ අංකය: ES/1/චක්‍රලේඛ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2138/27 හා 2019.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කර අංක 2138/27 හා 2019 අගෝස්තු මස 28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ පස්වන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදු කරනු ලැබේ.

01.**තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම**

1.1) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1හි අනු අංක (vii) යටතේ සඳහන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම හා එම වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හැර 10.1.1.1 යටතේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019 පෙබරවාරි මස 26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1.2) සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක (iv) යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුළ සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

1.3) සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක (iv) යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුළ සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඇතුලුව මෙම චක්‍රලේඛයේ 1.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

02. <u>දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම</u>

2.1) සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට දෙවන (II) ශ්‍රේණියේ සිටින නිලධාරීන් පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේදී සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි (i) සහ (iii) යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) දෙවන (II) ශ්‍රේණියේ වසර දෙකක (02) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා දෙවන (II) ශ්‍රේණියට උසස් වීමෙන් පසු වැටුප් වර්ධක දෙකක් (02) උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව දෙවන (II) ශ්‍රේණියට උසස් වීමෙන් පසුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙකක් (02) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

2.2) සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට තුන්වන (III) ශ්‍රේණියේ වසර හයකට (06) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1 හි දක්වා ඇති විධිවිධාන අනුව දෙවන (II) ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේදී 10.2.1 හි (i) සහ (iii) යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) III සහ II ශ්‍රේණිවල වසර දොළහක (12) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහක් (11) උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දොළහක් (12) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන

2019 පෙබරවාරි මස 26 දිනට පෙර ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියේ වසර හයකට (06) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.3 හි සඳහන් විධිවිධාන අනුව දෙවන (II) ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේදී එම නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා ගනු ලැබූ අමතර කාල සීමාවට සමාන කාල සීමාවකින් එම නිලධාරීන්ගේ පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම ප්‍රමාද කරනු ලැබේ.

2.3) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති මෙම චක්‍රලේඛයේ අනු අංක 01 යටතේ සඳහන් විධිවිධාන අනුව දෙවන (II) ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරීන් පළමුවන (I) ශ්‍රේණියට උසස් වීමට පෙර සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක (vii) යටතේ සඳහන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම හා එම වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර තිබිය යුතුය.

සටහන

2019 පෙබරවාරි මස 26 දිනට පසු සේවයට බඳවාගනු ලබන නිලධාරීන් තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීමේදී සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක (vii) යටතේ සඳහන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම හා එම වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවන අතර එම නිලධාරීන් දෙවන (II ) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේදී එම සුදුසුකම සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය අනුව නිකුත් කරනු ලැබේ.

එස්.හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය